# තේ මල්ලිගෙ වික්‍රමය






ශ්‍රීනාත් මද්දුමගේ

ටෙලිනාට්‍යයක් නිෂ්පාදනය කරනකොට තේ මල්ලිලාට ලැබෙන්නෙ විශාල තැනක්. වෙලාවක් කලාවක් නැතිව මහන්සිවෙන නලු නිළියන් කාර්මික ශිල්පීන් ඇතුලු සකළවිධ කට්ටියට වෙලාවට තේ එක නොලැබුණොත් ප්‍රශ්න ගොඩයි. ඉතින් හැම ටෙලි නාට්‍ය කණ්ඩායමකම වගේ තේ හදන්න මල්ලි කෙනෙක් ඉන්නවාමයි.

අනාගතයේ මේ ක්ෂෙත්‍රයේ මොකක් හෝ තැනකට ඇතුල් වෙන්න බලාගෙන ටෙලිනාට්‍ය කණ්ඩායමක් සමීපයේ ගැවසෙන්න උත්සාහ කරන හුඟක් අය අඩුම ගානෙ තේ හදන වැඩේ හරි ඉල්ලාගෙන එන අවස්ථා බොහොමයි. ඒඅ ය තමන්ගෙ අරමුණ වෙනුවෙන් ඒ තරම්ම කැප වෙනවා. එහෙම තේ හදන්න හරි ඉඩ දෙන්න කියා ඉඩක් ලබාගෙන අවසානයේ ඉතා ඉහළ රංග ශිල්පීන් වුණ නලුවන් කීප දෙනෙක්ම මම දන්නවා. ඒ නිසා තේ හදන මල්ලිලාට තවත් වැදගත් කමක් ආරෝපනය වෙලා තියෙනවා.

තේ හදන එක නම් ඒ හැටි කාරියක් නෙවෙයිනෙ. ඒත් ප්‍රශ්නෙ තිහ හතළිහක කණ්ඩායමකට තේ හදන එකයි. මොකද කණ්ඩායමේ එක එක අයගෙ තේ අවශ්‍යතා විවිධයි.

කහට තේ
අඩු සීනි කහට තේ
වැඩි සීනි කහට තේ
කිරි තේ
අඩු සීනි කිරි තේ
වැඩි සීනි කිරි තේ
වැඩි කහට තේ
අඩු කහට තේ

ඔය වගේ නානාප්‍රකාර වර්ගයේ තේ තමයි එක එක්කෙනා බොන්නෙ. ඉතින් මේ හැමෝම ෂතුටු කරන්න පුලුවන් තේ මල්ලිලා නම් කොහේවත් හිටිය නැහැ. ඒත් පුදුමෙකට වගේ හැමෝම සමතුටු කරන්න පුලුවන් විදිහට එක එක්කෙනාට අවශ්‍ය ආකාරයටම තේ හදා දෙන්න පුලුවන් තේ මල්ලි කෙනෙක් මට වතාවක් ටෙලි නාට්‍ය කණ්ඩායමකදී හමු වුණා.

ඔන්න මිනිහා ඉස්සෙල්ලාම රවුමක් යනවා. එක එක්කෙනාට අවශ්‍ය තේ වර්ගය අහනවා. ඊට පස්සෙ ගිහින් බොහොම කඩිසරේට තේ හදාගෙන එනවා වීදුරු වල දාගෙන. එක එක්කෙනා ළඟට ගිහින් තේ වීදුරුව අතටම දෙනවා

"මෙන්න අයියගෙ වැඩි කහට තේ එක"

"මෙන්න අක්කගෙ අඩු සීනි කිරි තේ එක"

"මෙන්න ඒඩී ගෙ අඩු සීනි කහට තේ එක"

"මෙන්න අයියගෙ වැඩි සීනි කිරි තේ එක"

ඔය විදිහට අදාල කෙනාට අදාල තේ එක දෙන්න මිනිහ හරිම දස්සයි. ඉතින් තමන්ට අවශ්‍ය ආකාරයටම තේ හදල දෙන මේ තේ මල්ලි හරිම ජනප්‍රියයි.

මමත් දවසක් දෙකක් මේ දක්ෂයාගෙ වැඩේ බලන් හිටියා. මිනිහත් මාත් එක්ක බොහොම කුළුපග වුණා. තුන්වෙනි දවසෙ මං මිහිහව පැත්තකට අල්ලගත්තා.

"හැබෑටම කොහොමද මල්ලි ඔයා මේ විදිහට එක එක්කෙනාට අවශ්‍ය ආකාරයටම තේ හදල දෙන්නෙ?" මං ඇහුවා.

තේ මල්ලි ටික වෙලාවක් අමුතු විදිහට හිනා වෙවී මා දිහා බලන් හිටියා.

"පිස්සුද අයියා.. කාටද පුලුවන් ඔය එක එක්කෙනා කියන විදිහට තේ හදන්ඩ. මං හදන්නෙ තේ ජාති දෙකයි. කහට තේ සහ කිරි තේ. ඒ ජාති දෙක තමයි මං ඔය හැමෝටම බෙදලා දෙන්නෙ.. එක එක්කෙනා ඉල්ලපු ජාතිය මතක තියං ඉඳලා ඒ නම කියලා මං තේ එක දෙනවා.. වැඩේ ෂේප්.. හැමෝම සතුටුයි.. මාත් සතුටුයි"




